**අභ්‍යන්තර සංදේශය**

**පාලන අංශය**

| | | |
|---|---|---|
| වෙත | : | සියලුම අංශ ප්‍රධානීන් / ආයතන ප්‍රධානීන් |
| වෙතින් | : | අතිරේක ලේකම්(පාලන) |
| විෂය | : | ප්‍රාථමික ශ්‍රේණියේ නිලධාරීන් හට 2026.05.25 දින සිට ආරම්භ වන පැය 100 දෙමළ භාෂා පුහුණු පාඨමාලාව |
| ප්‍රමුඛත්වය | : | ඉතා වැදගත් |
| දිනය | : | 2026.05. 22 |
| ගොනු අංකය | : | MWCA/02/05/21/30/10/14(2026) |

---

01. උක්ත කරුණ සම්බන්ධයෙන් මගේ සමාංක හා 2026.05.20 දිනැති අභ්‍යන්තර සංදේශය හා බැඳේ.

02. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 ප්‍රකාරව රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය යටතේ ප්‍රාථමික ශ්‍රේණියේ නිලධාරීන් හට නියමිත පැය 100 දෙමළ භාෂා පුහුණු පාඨමාලාව සම්බන්ධයෙන් වන යථෝක්ත අභ්‍යන්තර සංදේශය සමග යොමු කර ඇති ඇමුණුම්හි නම් සඳහන් නිලධාරීන් ඔබ ආයතනයෙහි/අංශයෙහි සේවය කරනු ලබන්නේ නම්, එම පුහුණු පාඨමාලාව සඳහා සහභාගී වීමට අවශ්‍ය රාජකාරි නිවාඩු අනුමත කිරීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස කාරුණිකව දැනුම් දෙමි.

03. තව ද, මෙම පුහුණු පාඨමාලාව පැවැත්වෙන දිනයන්හි සාමාන්‍ය පරිදි රාජකාරියට වාර්තා කිරීම සහ පිටවීම සටහන් කළ යුතු බවත් නිවාඩු ලබා ගැනීමේ දී ආයතන සංග්‍රහයේ XII පරිච්ඡේදය අනුව කටයුතු කළ යුතු වන බවට අදාල නිලධාරීන් දැනුවත් කරන ලෙසත් වැඩිදුරටත් දන්වා සිටිමි.

04. මේ සම්බන්ධයෙන් ඔබ දක්වන සහයෝගය බෙහෙවින් අගය කොට සලකමි.

**එම්.එච්.ජී.බණ්ඩාර**
**අතිරේක ලේකම් (පාලන)**
**ලේකම් වෙනුවට**

CamScanner